උග්‍ර වී ඇත. පසුගිය වසර කිහිපය මුළුල්ලේ අඩු වීමේ උපනතියක් පවතින හෝටල් උපයෝගිකරණය ගැන සළකා බැලීමේදී ධාරිතාවය පුළුල් කිරීමේ සැලසුම් කෙරෙහි නිසි තක්සේරුවක් කර නොමැති බව පෙනේ. 1983 දී උඩරට, මහ කොළඹ සහ කොළඹ නගරයේ වාර්ෂික උපයෝගිතා අනුපාතයන් පිළිවෙලින් සියයට 21 කින්, සියයට 19 කින් සහ සියයට 17 කින් පහත වැටුණි. ඇඳන්/කාමර අනුපාතය 1982 දී වූ 1.7 සිට 1983 දී 1.65 දක්වා පහත බැස ඇත. මෙයින් පෙන්නුම් කෙරෙන්නේ දෙනු ලැබූ සෑම කාමර 100 කම අමුත්තන් 165 දෙනකු නවාතැන් ගත් බවය. ශ්‍රේණිගත නවාතැන් අංශයේ පැවති අධි ධාරිතාවය නිසා නව හෝටල් යෝජනා ක්‍රම සඳහා මූල්‍යමය දිරි දීමනා (බදු විරාම සහ අවශ්‍ය උපකරණ ආනයනයේදී තිබූ තීරු බදු නිදහස) ලබා දීම 1983 අප්‍රේල් මාසයේ සිට රජය විසින් නතර කරනු ලැබිණි. මෙයට අනුරූපීව, මේ අංශයට ලබා දුන් මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය පහසුකම් ද, ආයෝජන සීමා කිරීමේ අරමුණ ඇතිව අඩු කරන ලදී. පසුගිය සමයේ සිදුවුණු කලබල නිසා සංචාරක පැමිණීම් අඩු වීමෙන් ශ්‍රේණිගත නවාතැන් අංශයට ඉතා තියුණු බලපෑමක් ඇති වූ අතර, මූල්‍යමය ශක්‍යතාවය ආරක්ෂා කිරීම වස්, සමහර නිකේතන හෝටල් කොටස් වශයෙන් වැසීමට ද සේවකයන් ඉවත් කිරීමට ද සිදු විය. හෝටල් ගණනාවක්ම දරුණු මූල්‍යමය දුෂ්කරතාවලට මුහුණ පෑවේය.

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයෙහි පුනර්ජීවනයක් ඇති කිරීමේ අදහසින්, පිටරට සිට මෙරටට සංචාරකයන් ඇද ගැනීම සඳහා විදේශයන්හි විශාල ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කිරීම පිණිස රජය මගින් රුපියල් දශ ලක්ෂ 40 ක මුදලක් වෙන් කොට ඇත. එසේම සංචාරක කටයුතු අඩු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම කර්මාන්තය මුහුණ පෑ දුෂ්කරතාවයන් මැඩ පවත්වනු වස් රජය මගින්, සංචාරක අංශය සඳහා වූ ව්‍යාපාර පිරිවැටුම් බද්ද සියයට 15 සිට සියයට 10 දක්වා පහත හෙලන ලදී. පටු වෙළඳපොලක් කෙරෙහි රැඳී සිටීමෙන් මතු වන ගැටළු වලින් මිදීමේ අපේක්ෂාවෙන් සංචාරක ව්‍යාපාරය නංවාලීමේ නව උපාය මාර්ගයක් වශයෙන් සංචාරකයන් පැමිණෙන වෙනත් වෙළඳපොලවල් සොයා ගැනීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරගෙන යයි. මෙතෙක් කල් ශ්‍රී ලංකාව පසු කරමින් යන වෙළඳපොලේ ඉහළ ආදායම් ලබන කොටස් ඇද ගැනීම සඳහාත්, වැඩි ආදායම් උපදවා ගතහැකි සංචාරකයන්ට විශේෂ උනන්දුවක් ඇති කිරීම සඳහාත් සැලසුම් සකස් කර ඇත.


## ගෙවුම් තුලනය

### ගෙවුම් තුලන විග්‍රහය

1983 දී දක්නට ලැබුණු වෙළෙඳ අනුපාතයේ කැපී පෙනෙන දියුණුව සහ විදේශයන්හි සේවය කරන්නන් විසින් එවනු ලැබූ ප්‍රේෂණයන් තවදුරටත් ඉහළ යාම, විගැහි වටිනාකම් අනුව සලකා බැලීමේදී ජංගම ගිණුමේ හිඟය සැළකිය යුතු ප්‍රමාණයකින් පටු කිරීමට හේතු විය. 1982 පැවති රුපියල් දශ ලක්ෂ 11,919 (විගැහි දශ ලක්ෂ 519) ක් වූ ජංගම ගිණුම් හිඟය සමඟ සසඳන විට 1983 දී එය රුපියල් දශ ලක්ෂ 11,185 (විගැහි දශ ලක්ෂ 445) ක් ව පැවතුනි. 1982 වසරේ පිරිහුණු ගෙවුම් තුලන තත්ත්වයට හේතු වූ සාධකයන්හි තියුණු වෙනසක් මෙම වසර තුළදී දක්නට ලැබුනි. 1977 සිට අඛණ්ඩ ලෙස පිරිහෙමින් පැවතුන වෙළෙඳ අනුපාතය, ප්‍රධාන වශයෙන්ම, ශ්‍රී ලංකාවේ වැවිලි අපනයන මිළයන්හි හදිසි ඉහළ නැගීම සහ ඛනිජ තෙල් මිළ ගණන් පහත වැටීම නිසා 1983 වසරේදී ශ්‍රී ලංකාවට වාසිදායක ලෙස වෙනස් විය. මන්දගාමී අපනයන වර්ධනයක් හා සීඝ්‍ර ආනයන වර්ධනයක් දක්නට ලැබුණු 1982 වසර හා සැසඳීමේදී 1983 දී විගැහි වටිනාකම් අනුව ආනයන සියයට 1 කින් පහළ වැටෙද්දී අපනයන සියයට 7.6 කින් ඉහළ නැගුනි. දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් ජංගම ගිණුමේ හිඟය 1982 සියයට 11.9 සිට 1983 දී සියයට 9.4 ක් දක්වා අඩු විය. නිල සංක්‍රාම ඉවත් කළවිට ජංගම ගිණුමේ හිඟය 1982 දී රුපියල් දශ ලක්ෂ 15,298 (විගැහි දශ ලක්ෂ 666) ක් වූ අතර, මෙම වසරේදී එය රුපියල් දශ ලක්ෂ 15,201 (විගැහි දශ ලක්ෂ 605) ක් විය. මෙය දළ ජාතික නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගත්කල එය වර්ෂ දෙක අතරදී සියයට 15.3 සිට 12.4 දක්වා පහත වැටීමක් පෙන්නුම් කරයි.

# ගෙවුම් තුලනය

වාර්ෂිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

UNIVERSITY OF MORATUWA LIBRARY

## 1 . 41 සංඛ්‍යා සටහන

## ගෙවුම් තුලනය—විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම 1979 — 1983

| ශීර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | | | විගැහි දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1979 | 1980 | 1981 (අ) | 1982 (අ) | 1983 (ආ) | 1979 | 1980 | 1981 (අ) | 1982 (අ) | 1983 (ආ) |
| 1. වෙළෙඳ භාණ්ඩ .. .. | – 7,288 | – 16,312 | – 15,616 | – 20,403 | – 20,304 | – 362 | – 758 | – 693 | – 890 | – 808 |
| අපනයන (නැ. වි. ස.) .. .. | 15,282 | 17,603 | 20,507 | 21,098 | 24,917 | 759 | 818 | 903 | 918 | 988 |
| ආනයන (මි. ර. ගැ.) .. .. | – 22,570 | – 33,915 | – 36,123 | – 41,501 | – 45,221 | – 1,121 | – 1,576 | – 1,596 | – 1,808 | – 1,796 |
| 2. සේවා .. .. | + 739 | + 859 | + 82 | – 389 | – 1,297 | + 37 | + 40 | + 4 | – 16 | – 52 |
| ලැබීම් .. .. | 2,992 | 4,605 | 6,019 | 6,962 | 7,959 | 149 | 214 | 265 | 303 | 317 |
| ගෙවීම් .. .. | – 2,253 | – 3,746 | – 5,937 | – 7,351 | – 9,256 | – 112 | – 174 | – 261 | – 319 | – 369 |
| 3. භාණ්ඩ හා සේවා (1+2) .. | – 6,549 | – 15,453 | – 15,534 | – 20,792 | – 21,601 | – 325 | – 718 | – 689 | – 906 | – 860 |
| 4. සංක්‍රාම (ශුද්ධ) .. .. | + 2,993 | + 4,541 | +7,036 | + 8,873 | + 10,416 | + 148 | + 211 | + 308 | + 387 | + 415 |
| පෞද්ගලික (ශුද්ධ) .. .. | 754 | 2,260 | 3,918 | 5,494 | 6,400 | 37 | 105 | 172 | 240 | 255 |
| නිල (ශුද්ධ) .. .. | 2,239 | 2,281 | 3,118 | 3,379 | 4,016 | 111 | 106 | 136 | 147 | 160 |
| 5. ජංගම ගිණුම් ශේෂය (3+4) .. | – 3,556 | – 10,912 | – 8,498 | – 11,919 | – 11,185 | – 177 | – 507 | – 381 | – 519 | – 445 |
| 6. මූල්‍ය නොවන ප්‍රාග්ධනය .. | + 3,306 | + 6,585 | + 7,691 | + 10,813 | + 10,797 | + 164 | + 306 | + 341 | + 471 | + 428 |
| පෞද්ගලික අංශය .. .. | 874 | 3,981 | 2,571 | 5,516 | 3,389 | 43 | 185 | 116 | 240 | 136 |
| රාජ්‍ය අංශය .. .. | 2,432 | 2,604 | 5,120 | 5,297 | 7,408 | 121 | 121 | 225 | 231 | 292 |
| දිගු කාලීන (ශුද්ධ) .. | 2,432 | 2,604 | 5,120 | 5,297 | 7,410 | 121 | 121 | 225 | 231 | 292 |
| ලැබීම් .. .. | (3,351) | (4,326) | (6,087) | (6,814) | (9,256) | (167) | (201) | (267) | (298) | (365) |
| ආපසු ගෙවීම් .. | (– 919) | (–1,722) | (– 967) | (– 1,517) | (– 1,846) | (–46) | (–80) | (–42) | (–67) | (–73) |
| කෙටිකාලීන (ශුද්ධ) .. | — | — | — | — | – 2 | — | — | — | — | — |
| 7. රුපියල් අගය පිළිබඳ ගැලපිලි .. | – 18 | + 607 | – 39 | – 124 | + 82 | — | — | — | — | — |
| 8. වැරදීම් හා අත්හැරීම් .. | + 820 | + 495 | + 188 | + 81 | + 602 | + 36 | + 23 | + 2 | + 24 | + 16·5 |
| 9. විගැහි වෙන් කිරීම .. | 241 | 258 | 252 | — | — | 12 | 12 | 12 | — | — |
| 10. සමස්ත ශේෂය .. .. | + 793 | – 2,967 | – 406 | – 1.149 | + 296 | + 35 | – 166 | – 26 | – 24 | – 0·5 |
| 11. මූල්‍ය වෙනස්වීම .. .. | – 793 | + 2,967 | + 406 | + 1,149 | – 296 | – 35 | + 166 | + 26 | + 24 | + 0·5 |
| විනිමය අනුපාතිකයේ සාමාන්‍යය ශ්‍රී ල. රු./විගැහි .. .. | | | | | | 20.13 | 21.52 | 22.67 | 22.98 | 25·16 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.

සටහන : මූල්‍ය අංශයේ සියළු ගණුදෙනු කාලච්ඡේදය අවසානයේ අනුපාතිකයන් අනුව පරිවර්තනය කොට ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1 . 42 සංඛ්‍යා සටහන

## සේවා සහ සංක්‍රාම 1982–1983

රුපියල් දශ ලක්ෂ (විගැහි දශ ලක්ෂ වරහන් තුළ)

| ශීර්ෂය | බැර | | | හර | | | ශේෂය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1982(අ) | 1983(ආ) | වෙනස 1982/83 | 1982(අ) | 1983(ආ) | වෙනස 1982/83 | 1982 | 1983 |
| වරාය, ප්‍රවාහනය සහ රක්ෂණ .. .. | 1,219<br>(53) | 1,589<br>(63) | + 370<br>(+10) | 977<br>(42) | 1,318<br>(52) | + 341<br>(+10) | + 242<br>(+11) | + 271<br>(+11) |
| සංචාර .. .. | 2,678<br>(116) | 2,391<br>(96) | - 287<br>(- 20) | 842<br>(37) | 911<br>(36) | + 69<br>(- 1) | + 1,836<br>(+79) | + 1,480<br>(+60) |
| ආයෝජන ආදයම් .. .. | 912<br>(40) | 1,045<br>(42) | + 133<br>(+2) | 2,946<br>(128) | 4,209<br>(169) | + 1,263<br>(+41) | - 2,034<br>(- 88) | - 3,164<br>(- 127) |
| 1. ලාභ සහ ලාභාංශ .. | 7<br>(—) | 3<br>(—) | - 4<br>(—) | 218<br>(9) | 246<br>(10) | + 28<br>(+1) | - 211<br>(- 9) | - 243<br>(- 10) |
| 2. පොලී .. .. | 905<br>(40) | 1,042<br>(42) | + 137<br>(+2) | 2,728<br>(119) | 3,963<br>(159) | + 1,235<br>(+40) | - 1,823<br>(- 79) | - 2,921<br>(- 117) |
| රජයේ වියදම් .. .. | 273<br>(12) | 361<br>(14) | + 88<br>(+2) | 295<br>(13) | 292<br>(11) | - 3<br>(- 2) | - 22<br>(- 1) | + 69<br>(+3) |
| විවිධ .. .. | 1,880<br>(82) | 2,573<br>(102) | + 693<br>(+20) | 2,291<br>(99) | 2,526<br>(101) | + 235<br>(+2) | - 411<br>(- 17) | + 47<br>(+1) |
| මුළු සේවා .. .. | 6,962<br>(303) | 7,959<br>(317) | + 997<br>(+14) | 7,351<br>(319) | 9,256<br>(369) | + 1,905<br>(+50) | - 389<br>(- 16) | - 1,297<br>(- 52) |
| පෞද්ගලික සංක්‍රාම .. .. | 6,024<br>(263) | 6,857<br>(273) | + 833<br>(+10) | 530<br>(23) | 457<br>(18) | - 73<br>(- 5) | + 5,494<br>(+240) | + 6,400<br>(+255) |
| නිල සංක්‍රාම .. .. | 3,379<br>(147) | 4,016<br>(160) | + 637<br>(+13) | —<br>(—) | —<br>(—) | —<br>(—) | + 3,379<br>(+147) | + 4,016<br>(+160) |
| මුළු සංක්‍රාම .. .. | 9,403<br>(410) | 10,873<br>(433) | + 1,470<br>(+23) | 530<br>(23) | 457<br>(18) | - 73<br>(- 5) | + 8,873<br>(+387) | + 10,416<br>(+415) |
| මුළු සේවා සහ සංක්‍රාම .. .. | 16,365<br>(713) | 18,832<br>(750) | + 2,467<br>(+37) | 7,881<br>(342) | 9,713<br>(387) | + 1,832<br>(+45) | + 8,484<br>(+371) | + 9,119<br>(+363) |

(අ) සංශෝධිතයි.
(ආ) තාවකාලිකයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1982 වසරේ රුපියල් දශ ලක්ෂ 21,098 (විගැහි දශ ලක්ෂ 918) ක්ව පැවති අපනයන භාණ්ඩ ඉපැයුම් වටිනාකම 1983 දී රුපියල් දශ ලක්ෂ 24,917 (විගැහි දශ ලක්ෂ 988) ක් වූ අතර, එය විගැහි වටිනාකම් අනුව සියයට 7.6 ක වර්ධනයක් පෙන්නුම් කළේය. ප්‍රධාන වශයෙන් ඉතා වාසිදායක මිළ ගණන් ලබාගැනීමට හැකිවීම නිසා අපනයන ඉපැයුම්වල එකතුවේ සැළකියයුතු වෙනසක් දක්නට ලැබුණි. 1982 වසරේදී සියයට 6.9 කින් පහත වැටුනු සම්ප්‍රදායික වැවිලි අංශයෙන් ලද ඉපැයුම් 1983 දී සියයට 18.5 කින් ඉහළ නැගුනි. සම්ප්‍රදායික නොවන අපනයන වලින් (ඛනිජ තෙල් නිෂ්පාදිත හැර) ලත් ආදයම සියයට 5.7 කින් වර්ධනය විය. මෙම වර්ධනය මුලුමනින්ම රෙදිපිළි, ඇඟලුම් හා මැණික් අපනයන ආදයම් ඉහළ යාම මගින් සිදු විය.

ආනයන භාණ්ඩ සඳහා වූ පැහැදම විගැහි වටිනාකම අනුව සියයට 1 ක් වූ ඉතා සුළු අනුපාතයකින් පහත වැටුනි. පෙර වසරේ ආනයන සඳහා වූ මුලු පැහැදම වන රුපියල් දශ ලක්ෂ 41,501 (විගැහි දශ ලක්ෂ 1,808) සමග සැසඳීමේදී 1983 දී රුපියල් දශ ලක්ෂ 45,221 (විගැහි දශ ලක්ෂ 1,796) ක් විය. කෙසේ වුවද, ආනයන වියදම ආන්තික වශයෙන් අඩුවීමක් සමගම ආනයන සංයුතිය අන්තර් භාණ්ඩ සහ තරමක් දුරට ආයෝජන භාණ්ඩවල සිට පරිභෝජන භාණ්ඩවලට විතැන් වීමක් දක්නට ලැබුනි. 1982 වසර හා සැසඳීමේදී පාරිභෝජන භාණ්ඩ ආනයන පැහැදම සියයට 26 කින්, ඉහළ යද්දී අන්තර් භාණ්ඩ ආනයන පැහැදම (ඛනිජ තෙල් හැර) වර්ධනය වූයේ සියයට 6 කිනි. ඛනිජ තෙල් සහ ආයෝජන භාණ්ඩ ආනයන සඳහා වූ පැහැදම පහළ යාම පිළිවෙලින් සියයට 18 ක් සහ සියයට 5 ක් විය.

ගෙවුම් තුලනයේ සේවා ගිණුමේ හිඟය 1982 රුපියල් දශ ලක්ෂ 389 (විගැහි දශ ලක්ෂ 16) සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 1,297 (විගැහි දශ ලක්ෂ 52) ක් දක්වා පුළුල් විය. මෙම හිඟය පුළුල් වීම, සංචාරක ව්‍යාපාරයෙන් ලත් ශුද්ධ විදේශ විනිමය ලැබීම් අඩුවීමේ සහ විදේශ ණය සඳහා වූ පොළී සහ අනිකුත් ගෙවීම් ඉහළ යාමේ ප්‍රතිඵලයකි.

විදේශ ණය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් හැර ගැනීම් සහ වාණිජ ණය ගැනීම් සඳහා වූ පොළී ගෙවීම් සියයට 34 ක වර්ධනයක් පෙන්නුම් කරමින් 1982 දී රුපියල් දශ ලක්ෂ 2,728 (විගැහි දශ ලක්ෂ 119) සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 3,963 (විගැහි දශ ලක්ෂ 158) දක්වා වැඩි විය. විදේශ ණය මත වූ පොළී ගෙවීම් 1983 දී මුළු භාණ්ඩ හා සේවා අපනයනයන්ගෙන් ලත් විදේශ විනිමය ලැබීම් වලින් සියයට 10 ක් උකහා ගත්තේය. 1982 දී එම ප්‍රමාණය සියයට 8 ක් විය.

විදේශීය වත්කම් ආයෝජනය කිරීම මගින් ලත් පොළී ඉපැයුම් පෙර වසරේ පැවති රුපියල් දශ ලක්ෂ 905 (විගැහි දශ ලක්ෂ 40) හා සැසඳීමේදී 1983 දී රුපියල් දශ ලක්ෂ 1,042 (විගැහි දශ ලක්ෂ 42) ක් දක්වා වර්ධනය විය. පොළී ගණුදෙනු වලින් පමණක් පැන නැගුන හිඟය 1982 දී රුපියල් දශ ලක්ෂ 1,823 (විගැහි දශ ලක්ෂ 79) සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 2,921 (විගැහි දශ ලක්ෂ 117) ක් දක්වා වැඩි විය. ඒ සමගම ලාභ හා ලාභාංශ විශාල වශයෙන් පිටතට ගලායාමද හේතුවෙන් 1983 වර්ෂය තුළදී ආයෝජන ආදයම් ශීර්ෂය යටතේ වූ හිඟය රුපියල් දශ ලක්ෂ 1,130 (විගැහි දශ ලක්ෂ 39) කින් ඉහළ නැඟුණි. මේ අනුව පසුගිය වර්ෂවලදී මෙන්ම විදේශ ණය මතවූ පොළී ගෙවීම්වල වර්ධනය තවදුරටත් අඛණ්ඩව පැවතුනි. ආර්ථිකය සතු විදේශ සම්පත් වලින් විදේශීය ණය සේවාකරණය වෙනුවෙන් වෙන්කළ යුතු කොටස ඉහළ නගිමින් පවතින තත්ත්වය යටතේ මෙය දැඩි අවධානයට යොමුවිය යුතු කරුණකි.

සේවා ගිණුමේ විදේශ විනිමය ඉපැයුම්වල ප්‍රධාන මූලාශ්‍රයන් වූයේ, රුපියල් දශ ලක්ෂ 1,411 (විගැහි දශ ලක්ෂ 71) ක්වූ වරාය, ප්‍රවාහන, රක්ෂණ සහ සංචාරක ව්‍යාපාරයයි. සංචාරක ව්‍යාපාරයෙන් ලත් ඉපැයුම් පහත වැටුනු අතර, වරාය, ප්‍රවාහන හා රක්ෂණ මගින් ලද ශුද්ධ ලැබීම් පෙර වසරේ පැවැති මට්ටමේම පැවතුනි. ජූලි කලබල වල දුර්විපාකයක් වශයෙන් සංචාරක ව්‍යාපාරයෙන් ලත් ඉපැයුම් 1982 දී රුපියල් දශ ලක්ෂ 2,678 (විගැහි දශ ලක්ෂ 11 )

සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 2,391 (විගැහි දශ ලක්ෂ 96) දක්වා සියයට 17 කින් පහත වැටුනි. අනික් අතට, විදෙශයන්හි සංචාරය කරන ශ්‍රී ලාංකිකයන් විසින් කල වියදම් විගැහි වටිනාකම් අනුව ඉතා සුළු අඩු වීමක් පෙන්නුම් කලේය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පෙර වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 1,836 (විගැහි දශ ලක්ෂ 79) ක් වූ සංචාරක ව්‍යාපාරයෙන් ලත් ශුද්ධ ලැබීම් 1983 දී රුපියල් දශ ලක්ෂ 1,480 (විගැහි දශ ලක්ෂ 60) ක් බවට පත් විය.

පසුගිය වර්ෂවලදී මෙන්ම විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන්ගෙන් ලත් ප්‍රේෂණයන්ගෙන් සමන්විත වන පෞද්ගලික සංක්‍රාම ලැබීම් විමසුමට අදාළ වර්ෂය තුළදී ද ඉහළ නැගුණි. කෙසේ වුවද, පසුගිය වසරේ පැවති සියයට 35 ක වර්ධනය සමග සසඳන කල 1983 දී එම වර්ධනය සියයට 4 කට සීමා විණි. පෞද්ගලික සංක්‍රාමයන්ගෙන් ලත් දළ ලැබීම් 1982 වසරේ පැවති රුපියල් දශ ලක්ෂ 6,024 (විගැහි දශ ලක්ෂ 263) මට්ටමේ සිට මෙම වසර තුළ රුපියල් දශ ලක්ෂ 6,857 (විගැහි දශ ලක්ෂ 273) දක්වා වැඩි වූ අතර, එමගින් ලත් ශුද්ධ ලැබීම් ද 1982 පැවති රුපියල් දශ ලක්ෂ 5,494 (විගැහි දශ ලක්ෂ 240) සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 6,400 (විගැහි දශ ලක්ෂ 255) ක් දක්වා ඉහළ නැගුණි. මේ අනුව වෙළෙඳ භාණ්ඩ ගිණුමේ සහ සේවා ගිණුමේ හිඟයයන් කැපී පෙනෙන ලෙස අඩු කිරීමට උපකාරී වෙමින් පෞද්ගලික සංක්‍රාම ලැබීම් ශ්‍රී ලංකා ගෙවුම් තුලනයේ වැදගත් අයිතමයක් බවට පත්ව ඇත.

යෝජනා ක්‍රම ආධාර, ආහාර ආධාර සහ අනෙකුත් ද්‍රව්‍යමය ආධාරයන්ගෙන් සමන්විත වූ නිල සංක්‍රාම ලැබීම් 1982 පැවති රුපියල් දශ ලක්ෂ 3,379 (විගැහි දශ ලක්ෂ 147) සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 4,061 (විගැහි දශ ලක්ෂ 160) දක්වා වර්ධනය විය. මෙම මුළු ලැබීම් වලින් සියයට 58 ක් යෝජනා ක්‍රම ආධාර වූ අතර ඉතිරිය ආහාර ඇතුළු අනිකුත් ආධාර වලින් සමන්විත විය. වර්ෂයේ පසු භාගය තුළදී හදිසි අවශ්‍යතා සහනාධාර වශයෙන් රුපියල් දශ ලක්ෂ 288 (විගැහි දශ ලක්ෂ 11) ක් ලැබුණි.

පෞද්ගලික හා නිල සංක්‍රාම ලැබීම්වල එකතුව 1982 පැවති රුපියල් දශ ලක්ෂ 8,873 (විගැහි දශ ලක්ෂ 387) සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 10,416 (විගැහි දශ ලක්ෂ 415) දක්වා වර්ධනය වෙමින් භාණ්ඩ හා සේවා ගිණුම්වල හිඟයයන් සැළකිය යුතු ප්‍රමාණයකින් අඩු කිරීමට දයක විය. මෙම වසරේ වෙළෙඳ භාණ්ඩ ගිණුමේ හිඟය පමණක් රුපියල් දශ ලක්ෂ 21,601 (විගැහි දශ ලක්ෂ 860) ක් වූ අතර ජංගම ගිණුමේ හිඟය රුපියල් දශ ලක්ෂ 11,185 (විගැහි දශ ලක්ෂ 445) ක් විය. පසුගිය වසරේදී මෙන්ම මෙම වසර තුළද ජංගම ගිණුමේ හිඟය බොහෝදුරට පියවා ගනු ලැබුවේ සෘජු ආයෝජන, දිගු හා මධ්‍ය කාලීන ණය ආධාර, වාණිජ ණය ගැනීම් මෙන්ම අනිකුත් කෙටිකාලීන ණය උපයෝගී කර ගැනීම මගිනි.

රාජ්‍ය සහ පෞද්ගලික අංශ වෙත ගලා ආ මූල්‍ය නොවන ශුද්ධ ප්‍රාග්ධනය 1982 පැවති රුපියල් දශ ලක්ෂ 10,813 (විගැහි දශ ලක්ෂ 471) හා සැසඳීමේදී 1983 දී රුපියල් දශ ලක්ෂ 10,797 (විගැහි දශ ලක්ෂ 428) දක්වා වැඩි විය. මෙය එම මූලයන්ගෙන් 1982 දී ලත් මුළු ඉපැයුම්වලට වඩා විගැහි වටිනාකම් අනුව සියයට 9 ක පහත වැටීමක් පෙන්වයි. කෙසේ වුවද, මූල්‍ය නොවන ශුද්ධ ප්‍රාග්ධන ගලා ඒම්වල අඩු වීම මුළුමනින්ම සිදු වූයේ පෞද්ගලික අංශයෙහිය. පෞද්ගලික අංශයේ ප්‍රාග්ධන ගලා ඒම් විගැහි දශ ලක්ෂ 104 කින් පහත වැටෙමින් 1983 දී රුපියල් දශ ලක්ෂ 3,389 (විගැහි දශ ලක්ෂ 136) ක් විය. මෙම වර්ෂ දෙක අතර රාජ්‍ය අංශය වෙතට ඇදී ආ මූල්‍ය නොවන ප්‍රාග්ධනය රුපියල් දශ ලක්ෂ 5,297 (විගැහි දශ ලක්ෂ 231) සිට රුපියල් දශ ලක්ෂ 7,408 (විගැහි දශ ලක්ෂ 291) දක්වා ඉහළ නැගුණි.

**1 . 43 සංඛ්‍යා සටහන**

**විදේශ සම්පත් පරතරය පියවීම 1981—1983**

| වර්ගය | රුපියල් දශ ලක්ෂ | | | විගැහි දශ ලක්ෂ | | |
|---|---|---|---|---|---|---|
| | (අ) 1981 | (අ) 1982 | (ආ) 1983 | (අ) 1981 | (අ) 1982 | (ආ) 1983 |
| **1. විදේශීය ඉපැයීම් .. ..** | **30,956** | **34,084** | **39,733** | **1,363** | **1,484** | **1,578** |
| 1.1 ආනයන .. .. | 20,507 | 21,098 | 24,917 | 903 | 918 | 988 |
| 1.2 සේවා .. .. | 6,019 | 6,962 | 7,959 | 265 | 303 | 317 |
| 1.3 පෞද්ගලික සංක්‍රාම .. | 4,430 | 6,024 | 6,857 | 195 | 263 | 273 |
| **2. විදේශීය ගෙවීම් .. ..** | **56,339** | **63,458** | **72,493** | **2,487** | **2,765** | **2,890** |
| 2.1 ආනයන .. .. | 36,123 | 41,501 | 45,221 | 1,596 | 1,808 | 1,796 |
| 2.2 සේවා .. .. | 5,937 | 7,351 | 9,256 | 261 | 319 | 369 |
| 2.3 පෞද්ගලික සංක්‍රාම .. | 512 | 530 | 457 | 23 | 23 | 18 |
| 2.4 ප්‍රාග්ධන ආපසු ගෙවීම් .. | 13,767 | 14,076 | 17,559 | 607 | 615 | 707 |
| **3. විදේශ සම්පත් පරතරය ..** | **- 25,383** | **- 29,374** | **- 32,760** | **- 1,124** | **- 1,281** | **- 1,312** |
| **4. සම්පත් පරතරය පියවීම ..** | **+ 25,383** | **+ 29,374** | **+ 32,760** | **+1,124** | **+1,281** | **+1,312** |
| 4.1 ණය තත්ත්වය කෙරෙහි බල නොපාන ගණුදෙනු තුලින් පියවීම | 4,373 | 4,756 | 4,943 | 192 | 207 | 197 |
| 4.1.1 නිල ප්‍රදාන .. | 3,118 | 3,379 | 4,016 | 136 | 147 | 160 |
| 4.1.2 සෘජු ආයෝජන .. | 1,003 | 1,377 | 927 | 44 | 60 | 37 |
| 4.1.3 විගැහි වෙන්කිරීම් .. | 252 | — | — | 12 | — | — |
| 4.2 ණය ලබාගැනීම් සහ සංචිත උපයෝගීකර ගැනීම | 20,861 | 24,661 | 27,134 | 930 | 1,050 | 1,098 |
| 4.2.1 දිගු කාලීන ණය .. | 5,350 | 5,987 | 7,329 | 234 | 262 | 290 |
| 4.2.2 කෙටි කාලීන ණය .. | 10,966 | 10,504 | 14,172 | 485 | 459 | 564 |
| 4.2.3 සැපයුම්කරුවන්ගේ ණය සහ අනිකුත් දිගුකාලීන ණය .. | 785 | 4,284 | 2,602 | 35 | 186 | 102 |
| 4.2.4 වෙළෙඳ ණය ගැනීම් (පෞද්ගලික අංශය) .. | 1,546 | 1,585 | 1,872 | 68 | 69 | 74 |
| 4.2.5 බැංකු ණයගැනීම් .. | — | 1,595 | 30 | — | 68 | — |
| 4.2.6 ද්විපාර්ශ්වික ශේෂ .. | — | — | — | — | — | — |
| 4.2.7 ජා. මූ. අ. හැර ගැනීම් .. | 4,528 | 1,369 | 1,623 | 194 | 39 | 47 |
| 4.2.8 වෙනත් .. .. | 142 | 1,071 | 1,252 | 5 | 46 | 41 |
| 4.2.9 සංචිත .. .. | - 2,456 | - 1,734 | - 1,746 | - 91 | - 79 | - 20 |
| **5. රුපියල් අගය පිළිබඳ ගැලපිලි ..** | **- 39** | **- 124** | **+ 81** | — | — | — |
| **6. වැරදීම් හා අත්හැරීම් ..** | **+ 188** | **+ 81** | **+ 602** | **+ 2** | **+ 24** | **+ 17** |

(අ) සංශෝධිත.

(ආ) තාවකාලික.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

පෞද්ගලික අංශය වෙතට වූ මූල්‍ය නොවන ප්‍රාග්ධන ලැබීම්වල පහත වැටීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ, විශේෂයෙන් මහ කොළඹ ආර්ථික කොමිසම සහ විදේශ ආයෝජන උපදේශක කමිටුව යටතේ ඇති ව්‍යවසායයන් වෙතට ඇදී ආ සෘජු ආයෝජන පහත වැටීමත්, ලංකා නැව් සංස්ථාව සහ එයාර් ලංකා සමාගම මගින් ශුද්ධ විදේශ ණය උපයෝජනය කිරීම සැළකිය යුතු ලෙස අඩු වීමත්ය. 1982 දී මහ කොළඹ ආර්ථික කොමිසම, විදේශ ආයෝජන උපදේශක කමිටුව සහ අනෙකුත් ව්‍යවසායයන් වෙතට රුපියල් දශ ලක්ෂ 1,377 (විගැහි දශ ලක්ෂ 60) ක් සෘජු ආයෝජන වශයෙන් ලැබුණු නමුත් 1983 දී මෙම ලැබීම් රුපියල් දශ ලක්ෂ 927 (විගැහි දශ ලක්ෂ 37) ක් විය. එයාර් ලංකා සමාගම මගින් ශුද්ධ විදේශ ණය උපයෝජනය කිරීම 1982 දී රුපියල් දශ ලක්ෂ 2,980 (විගැහි දශ ලක්ෂ 130) ක් වූ අතර 1983 දී එය රුපියල් දශ ලක්ෂ 479 (විගැහි දශ ලක්ෂ 19) ක් ව පැවතුණි. සැපයුම් කරුවන්ගේ ණය සහ වෙනත් වාණිජ හැර

ගැනීම් වලින් යුක්ත වූ පෞද්ගලික අංශය වෙත ලැබුණු අනිකුත් දිගුකාලීන මූල්‍ය නොවන ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම 1983 වසර තුළ සියයට 8 ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් දශ ලක්ෂ 1,264 (විගැහි දශ ලක්ෂ 50) ක් ව පැවතුණි. ගෙවුම් තුලන හිඟය පියවා ගැනීමට උපයෝගී කරගත් කෙටිකාලීන ශුද්ධ ණය ගැනීම් ප්‍රමාණය 1982 දී රුපියල් දශ ලක්ෂ 147 (විගැහි දශ ලක්ෂ 7) සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 754 (විගැහි දශ ලක්ෂ 32) දක්වා වැඩි විය. රාජ්‍ය අංශය වෙතට ඇදී ආ මූල්‍ය නොවන ප්‍රාග්ධනය ඉහළ යාම, යෝජනා ක්‍රම ණය රුපියල් දශ ලක්ෂ 3,786 (විගැහි දශ ලක්ෂ 166) සිට රුපියල් දශ ලක්ෂ 5,384 (විගැහි දශ ලක්ෂ 213) දක්වා වැඩි වීමේත්, භාණ්ඩ ණය රුපියල් දශ ලක්ෂ 1,111 (විගැහි දශ ලක්ෂ 48) සිට රුපියල් දශ ලක්ෂ 1,338 (විගැහි දශ ලක්ෂ 53) දක්වා වැඩි වීමේත් ඒකාබද්ධ ප්‍රතිඵලයකි.

1983 වසරේ රජයේ වාණිජ ණය ගැනීම් යුරෝ ව්‍යවහාර මුදල් ණයකට සීමා වූ අතර එය රුපියල් දශ ලක්ෂ 607 (විගැහි දශ ලක්ෂ 24) ක් විය. වාණිජ ණය ගැනීම් මත වූ රජයේ රැඳියාව පෙර වසරට වඩා අඩකින් පමණ පහත වැටීම මෙම වසරේ ගෙවුම් තුලන තත්ත්වයේ දක්නට ලැබුණු හිතකර ප්‍රවනතාවක් විය. ණය ආපසු ගෙවීම් සහ දැනට සාදගෙන යන යෝජනා ක්‍රම සඳහා අත්තිකාරම් ගෙවීම් 1982 දී රුපියල් දශ ලක්ෂ 1,517 (විගැහි දශ ලක්ෂ 67) ක් වූ අතර එය මෙම වසර තුළදී රුපියල් දශ ලක්ෂ 1,847 (විගැහි දශ ලක්ෂ 74) ක් දක්වා වැඩි වුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ගෙවුම් තුලන හිඟය පියවීමට උපයෝගී කොට ගත් රාජ්‍ය අංශයට ලැබුන ශුද්ධ මූල්‍ය නොවන ප්‍රාග්ධන ප්‍රමාණය 1983 වසර තුළදී සියයට 26 කින් වර්ධනය විය.

ගෙවුම් තුලන හිඟය පියවා ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබා ගත් සම්පත් ප්‍රමාණය 1983 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 880 (විගැහි දශ ලක්ෂ 36) ක් විය. මෙය සමන්විත වූයේ සම්භාර තොග මූල්‍යකරණ පහසුකම් යටතේ (රබර් සඳහා) ලබා ගත් රුපියල් දශ ලක්ෂ 136 (විගැහි දශ ලක්ෂ 6) කින් සහ සමීපස්ථ ණය පහසුකම් යටතේ මුල් හැර ගැනීම් දෙකක එකතුව වූ රුපියල් දශ ලක්ෂ 745 (විගැහි දශ ලක්ෂ 30) යන හැර ගැනීම් වලිනි. මීට අමතරව ශ්‍රී ලංකා සලාකය වැඩි වීමේ විගැහි කොටසට දයක ගෙවීම නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ලංකාව සතු සංචිත තත්ත්වය වසර තුළදී රුපියල් දශ ලක්ෂ 277 (විගැහි දශ ලක්ෂ 11) කින් ඉහළ නැගුණි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් මින් පෙර ගත් ණය සඳහා වූ ප්‍රති මිළදී ගැනීම් 1983 වසරේදී රුපියල් දශ ලක්ෂ 1,097 (විගැහි දශ ලක්ෂ 46) ක් විය.

**විදේශ වත්කම්**

ශ්‍රී ලංකාවේ ශුද්ධ විදේශ වත්කම් ප්‍රමාණය පෙර වසර හා සමාන මට්ටමකින් පවතිද්දී දළ විදේශ වත්කම් ප්‍රමාණය 1982 පැවති රුපියල් දශ ලක්ෂ 11,094 (විගැහි දශ ලක්ෂ 472) සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 12,840 (විගැහි දශ ලක්ෂ 491) දක්වා ඉහළ නැගුණි. ශ්‍රී ලංකාවේ දළ විදේශ වත්කම් තත්ත්වයේ මෙම වැඩි දියුණු වීම, වාණිජ බැංකුවල විදේශීය ද්‍රවශීල ශේෂයන්හී එකතුව මෙන්ම ප්‍රතිවට්ටම් කරන ලද නිර්යාත බිල්පත් ද වැඩි වීම නිසා ඉහළ ගිය විදේශ වත්කම්වල ප්‍රතිඵලයකි.

මහ බැංකුව, වාණිජ බැංකු සහ රජය මෙන්ම රාජ්‍ය නියෝජ්‍යත්ව ආයතන සතුව පැවති දළ විදේශ වත්කම් ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 7,704 (විගැහි දශ ලක්ෂ 295), රුපියල් දශ ලක්ෂ 5,126 (විගැහි දශ ලක්ෂ 196) සහ රුපියල් දශ ලක්ෂ 10 (විගැහි දශ ලක්ෂ 0.4) ක් විය. මෙම මූලයන් සතුව පසුගිය වසරේ පැවති දළ විදේශ වත්කම් ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 7,234 (විගැහි දශ ලක්ෂ 308), රුපියල් දශ ලක්ෂ 3,585 (විගැහි දශ ලක්ෂ 152) ක් සහ රුපියල් දශ ලක්ෂ 276 (විගැහි දශ ලක්ෂ 12) ක් විය. 1983 වසර අවසානයේ පැවති දළ විදේශ වත්කම් ප්‍රමාණය 1984 සඳහා සිදු කිරීමට බලාපොරොත්තු වන ආනයන වලින් මාස තුනක කොටස සඳහා ප්‍රමාණවත් විය.

**1 . 44 සංඛ්‍යා සටහන**

**විනිමය අනුපාතික වෙනස්වීම් (අ) 1981—1983**

| මුදල් වර්ගය | වර්ෂය අවසානයේ විනිමය අනුපාතික (ඒකකයට රුපියල්) | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතය වෙනස්වීම් (ආ) | |
|---|---|---|---|---|---|
| | 1981 | 1982 | 1983 | 1982 | 1983 |
| විශේෂ ගැනුම් හිමිකම් .. | 23·8738 | 23·5569 | 26·1260 | (1·34) | 9·83 |
| ඇ. එ. ජ. ඩොලර් .. | 20·5500 | 21·3200 | 25·0000 | 3·61 | 14·72 |
| එ. රා. ස්ටර්ලින් පවුම් .. | 39·0965 | 34·6130 | 35·8938 | (12·95) | 3·57 |
| ඩොයිෂ් මාර්ක් .. | 9·0665 | 8·9806 | 9·1050 | (0·95) | 1·37 |
| ජපන් යෙන් .. | 0·09330 | 0·09123 | 0·10712 | (2·27) | 14·83 |
| ප්‍රංශ ප්‍රෑන්ක් .. | 3·5800 | 3·1726 | 2·9744 | (12·84) | (6·66) |
| ඉන්දියානු රුපියල් .. | 2·2063 | 2·1597 | 2·3531 | (2·16) | 8·22 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) වරහන් තුල ඇති සංඛ්‍යා ශ්‍රී ලකා රුපියලෙහි අගය වැඩිවීම පෙන්නුම් කරයි.


(ආ) ශ්‍රී ලංකා රුපියලෙහි විදේශීය මුදල් සමකය අනුව වෙනස්වීම් ගණන් බලා ඇත.

**විනිමය අනුපාතික වෙනස්වීම්**

ප්‍රධාන ජාත්‍යන්තර ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය වෙනස් වූ අන්දම විශ්ලේෂණය කිරීමේදී 1983 වසර තුළ ප්‍රංශ ප්‍රෑන්ක් මුදල හැර අනිකුත් සියළු ප්‍රධාන ව්‍යවහාර මුදල් වර්ගවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය පහත වැටී ඇති බව පෙන්නුම් කෙරෙයි. 1977 නොවැම්බර් 16 වැනි දින සිට වූ සමුච්චිත අගය පහළ වැටීම සියයට 36 ක් බවට පත් කරමින් මෙම වසර තුළ ඇමරිකා එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය සියයට 14.7 කින් පිරිහුණි. එසේම මෙම වසර තුළදී ජපන් යෙන්වලට ප්‍රතිමුඛව සියයට 14.8 කින්ද, ඉන්දියානු රුපියලට ප්‍රතිමුඛව සියයට 8.2 කින්ද, ස්ටර්ලින් පවුම හා ඩොයිෂ් මාර්ක් යන මුදල් වර්ග දෙකට ප්‍රතිමුඛව සියයට 3.6 බැගින්ද ශ්‍රී ලංකා රුපියලේ අගය පහත වැටුන අතර ප්‍රංශ ප්‍රෑන්ක් මුදලට ප්‍රතිමුඛව සියයට 6.7 ක අගය ඉහළ යාමක් විය. 1977 නොවැම්බර් 16 දින සිට ඇති වූ සමුච්චිත වෙනස්වීම්වලට අනුව ජපන් යෙන්, ඉන්දියානු රුපියල්, ස්ටර්ලින් පවුම් සහ ඩොයිෂ් මාර්ක් යන ව්‍යවහාර මුදල් වර්ගවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය පහල වැටීම පිළිවෙලින් සියයට 39.1 ක්, 21.3 ක්, 19.1 සහ සියයට 22 ක් වූ අතර එම කාලය තුළ ප්‍රංශ ප්‍රෑන්ක් මුදලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය ඉහළ යාම සියයට 10.5 ක් විය. 1977 නොවැම්බර් 16 දින සිට ඇති වූ සමුච්චිත අගය පහළ යාම සියයට 27.7 ක් බවට පත් කරමින් විගැහිවලට ප්‍රතිමුඛව ශ්‍රී ලංකා රුපියලේ අගය 1983 වසර තුළදී සියයට 9.8 කින් පිරිහුණි.

# විදේශ වත්කම්

ත්‍රෛමාසිකව





ශ්‍රී ලංකා මහ බැංකුව.

UNIVERSITY OF MORATUWA
LIBRARY
SRI LANKA

# විනිමය අනුපාතික

1977 නොවැම්බර් 16 වැනි දින සිට සමුච්චිත ප්‍රතිශත වෙනස්වීම




ශ්‍රී ලංකා මහ බැංකුව.

සටහන: 1977 වර්ෂය සඳහා අනුපාතික වෙනස්වීම් පෙන්වා ඇත්තේ නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහාය. පසු වර්ෂවල මෙම වෙනස්වීම් දක්වා ඇත්තේ කාර්තුගත පදනමක් මතය.

**විදේශ ණය**

දිගු හා මධ්‍ය කාලීන ණය, සැපයුම්කරුවන්ගේ රාජ්‍ය අංශයේ ණය (රාජ්‍ය සංස්ථා ඇතුළුව), රාජ්‍ය සංස්ථා සහ එයාර් ලංකා සමාගමේ වාණිජ ණය ගැනීම්, මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ පවතින ව්‍යවසායයන් සහ අනිකුත් අනුමත ව්‍යවසායයන් මගින් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක වලින් ගත් ණය, පෞද්ගලික විදේශ ණය හා වෙළෙඳ ණය ගැනීම්වලින් සමන්විත වූ ශ්‍රී ලංකාවේ නොපියවූ මුළු බාහිර ණය ගැනීම් 1982 දී රුපියල් දශ ලක්ෂ 53,737 (විගැහි දශ ලක්ෂ 2,286) ක් වූ අතර 1983 දී එය රුපියල් දශ ලක්ෂ 69,122 (විගැහි දශ ලක්ෂ 2,651) ක් ව පැවතුනි. මෙය පෙර වසර හා සැසඳීමේදී රුපියල් දශ ලක්ෂ 15,385 (විගැහි දශ ලක්ෂ 364) ක වැඩිවීමක් නිරූපනය කළේය.

**1.45 සංඛ්‍යා සටහන**

**නොපියවූ විදේශ ණය 1979—1983**

රුපියල් දශ ලක්ෂ (විගැහි දශ ලක්ෂ වරහන් තුළ)

| වර්ගය | 1979 | 1980 | 1981 | 1982 | 1983 |
|---|---|---|---|---|---|
| 1· දිගුකාලීන ණය මෙවායින් | 15,840·6 (778·6) | 22,276·8 (973·6) | 29,172·1 (1,219·6) | 34,597·3 (1,471·1) | 46,221·5 (1,765·9) |
| 1·1 ව්‍යාපෘති ණය | 5,062·6 (248·8) | 6,784·3 (296·5) | 9,232·7 (386·0) | 12,451·8 (529·5) | 19,531·0 (746·2) |
| 1·2 ව්‍යාපෘති නොවන ණය | 9,407·8 (462·4) | 13,305·5 (581·5) | 17,433·3 (728·8) | 19,545·6 (831·1) | 23,686·8 (905·0) |
| 1·3 ජා.මූ.අ. භාරකාර අරමුදල් ණය | 1,370·2 (67·4) | 2,187·0 (95·6) | 2,506·1 (104·8) | 2,599·9 (110·5) | 3,003·7 (114·7) |
| 2· සැපයුම්කරුවන්ගේ ණය | 828·6 (40·7) | 787·6 (34·4) | 1,110·4 (46·4) | 996·6 (42·4) | 920·7 (35·2) |
| 3· ජා.මූ.අ. හැර ගැනීම් | 2,501·2 (126·2) | 2,334·8 (112·6) | 5,319·3 (241·9) | 5,088·7 (217·8) | 4,870·3 (196·0) |
| 4· බැංකු ණය ගැනීම් | 69·1 (3·4) | 428·6 (18·7) | 266·9 (11·2) | 1,851·2 (78·7) | 1,873·1 (71·6) |
| 5· අනෙකුත් (අ) | 39·7 (2·0) | 4,231·5 (184·9) | 6,639·2 (277·6) | 11,203·0 (476·4) | 15,235·9 (582·1) |
| එකතුව | 19,279·2 (950·9) | 30,059·3 (1,324·2) | 42,507·9 (1,796·7) | 53,736·8 (2,286·4) | 69,121·5 (2,650·8) |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) රාජ්‍ය සංස්ථා සහ එයාර් ලංකා සමාගමේ වාණිජ ණය, ම.කො.ආ.කො. යටතේ පවතින ව්‍යවසායයන් සහ අනිකුත් අනුමත ව්‍යවසායයන් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක වලින් ගත් ණය, පෞද්ගලික විදේශ ණය හා වෙළෙඳ ණය ගැනීම් වලින් සමන්විත වේ.

ප්‍රධාන වශයෙන්ම සියයට 41 ක ශුද්ධ වැඩිවීමක් පෙන්වූ යෝජනාක්‍රම ණය ගැනීම් සහ සියයට 9 ක ඉහළ යාමක් පෙන්වූ යෝජනාක්‍රම නොවන ණය ගැනීම් ද නිසා මධ්‍යම ආණ්ඩුවේ දිගු හා මධ්‍ය කාලීන ණය ගැනීම් වසර තුළදී සියයට 20 කින් ඉහළ නැගුනි. මෙම අංශයේ දිගු හා මධ්‍ය කාලීන ණය ප්‍රමාණය 1983 වසරේ මුළු නොපියවූ ණය ප්‍රමාණයෙන් සියයට 67 කට සමාන විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ගත් නොපියවූ ණය ප්‍රමාණය 1982 දී රුපියල් දශ ලක්ෂ 5,089 (විගැහි දශ ලක්ෂ 218) සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 4,870 (විගැහි දශ ලක්ෂ 196) ක් දක්වා පහළ වැටුණි. නොපියවූ රාජ්‍ය අංශයේ සැපයුම්කරුවන්ගේ ණය සහ වාණිජ බැංකු විදේශ වලින් ගත් ණය මෙම වසර තුළදී පිළිවෙලින් සියයට 17 කින් සහ සියයට 9 කින් පහත වැටුනි. අනිකුත් සියලුම නොපියවූ ණය ගැනීම් 1982 දී රුපියල් දශ ලක්ෂ 11,203 (විගැහි දශ ලක්ෂ 476) සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 15,236 (විගැහි දශ ලක්ෂ 582) ක් දක්වා ඉහළ නැගුනි.

## 1.46 සංඛ්‍යා සටහන

### ණය සේවා ගෙවීම්

රුපියල් දශ ලක්ෂ (විගැහි දශ ලක්ෂ වරහන් තුළ)

| ශීර්ෂය | 1979 | 1980 | 1981 (අ) | 1982 (අ) | 1983 (ආ) |
|---|---|---|---|---|---|
| 1. ණය සේවා ගෙවීම් .. | 2,383·1 | 2,762·8 | 4,449·7 | 5,291·7 | 7,093·8 |
| | (118·0) | (137·0) | (197·4) | (230·7) | (285·3) |
| 1·1 ණය ආපසු ගෙවීම් .. | 1,627·4 | 1,781·5 | 2,084·1 | 2,563·3 | 3,131·3 |
| | (80·8) | (91·4) | (93·8) | (112·0) | (126·9) |
| (i) ජා.මූ. අරමුදලට .. | 622·6 | 748·5 | 1,289·2 | 1,146·3 | 1,097·3 |
| | (30·9) | (43·4) | (59·1) | (49·9) | (46·2) |
| (ii) අනෙකුත් (ඇ) .. | 1,004·8 | 1,033·0 | 794·9 | 1,417·0 | 2,034·0 |
| | (49·9) | (48·0) | (34·7) | (62·1) | (80·7) |
| 1·2 පොළී ගෙවීම් .. | 755·7 | 981·3 | 2,365·6 | 2,728·4 | 3,962·5 |
| | (37·2) | (45·6) | (103·6) | (118·7) | (158·4) |
| (i) ජා.මූ. අරමුදලට .. | 170·0 | 345·6 | 487·6 | 519·5 | 749·3 |
| | (8·4) | (12·4) | (21·7) | (22·4) | (30·8) |
| (ii) අනෙකුත් .. | 585·7 | 635·7 | 1,878·0 | 2,208·9 | 3,213·2 |
| | (28·8) | (33·2) | (81·9) | (96·3) | (127·6) |
| 2. භාණ්ඩ අපනයන හා සේවාවන්ගෙන් ඉපයීම් .. | 18,274·7 | 22,207·8 | 26,526·1 | 28,059·8 | 32,875·1 |
| | (907·7) | (1,032·0) | (1,168·2) | (1,221·7) | (1,305·2) |
| 3. භාණ්ඩ අපනයන, සේවා හා පෞද්ගලික සංක්‍රාමයන්ගෙන් ලැබීම් .. | 19,210·1 | 24,725·8 | 30,955·9 | 34,083·5 | 39,732·0 |
| | (954·0) | (1,149·0) | (1,363·3) | (1,484·1) | (1,578·0) |
| 4. ණය සේවා අනුපාතික (ඈ) (2 හි ප්‍රතිශතයක් වශයෙන්) .. | | | | | |
| (i) සමස්ත අනුපාතිකය | 13·0 | 12·4 | 16·8 | 18·9 | 21·6 |
| (ii) ජා.මූ.අ. හි ගණුදෙනු හැර | 8·7 | 7·5 | 10·1 | 12·9 | 16·0 |
| 5. ණය සේවා අනුපාතික (ඈ) (3 හි ප්‍රතිශතයක් වශයෙන්) | | | | | |
| (i) සමස්ත අනුපාතිකය .. | 12·4 | 11·2 | 14·4 | 15·5 | 17·9 |
| (ii) ජා.මූ.අ. හි ගණුදෙනු හැර | 8·3 | 6·7 | 8·6 | 10·6 | 13·2 |

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) ම.කො.ආ.කො. ව්‍යවසායයන්ට දෙන ලද විදේශ මුදල් බැංකු ඒකක ණය සම්බන්ධයෙන් හා විදේශ මුදල් බැංකු ඒකක මගින් අනෙකුත් අනුමත කරන ලද ව්‍යවසායයන්ට දෙන ලද ඇතැම් ණය සම්බන්ධයෙන් කරන ලද ණය ආපසු ගෙවීම් ඇතුළත් නොවේ. මේ සම්බන්ධ තොරතුරු ලැබී නොමැත.

(ඈ) රුපියල් අගය උපයෝගී කර ගනිමින් ගණනය කර ඇත. වර්ෂය තුළ විනිමය අනුපාතික වෙනස්වීම හේතුකොට ගෙන විගැහි අගය මත ගණනය කරන ලද ණය සේවා අනුපාතික මෙම අනුපාත වලින් වෙනස් වීමට ඉඩ ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

**විදේශ ණය සේවා ගෙවීම්**

දිගු හා මධ්‍ය කාලීන ණය ආපසු ගෙවීම් සහ දිගු, මධ්‍ය හා කෙටි කාලීන විදේශ ණය සඳහා වූ පොළී ගෙවීම් වලින් සමන්විත වූ විදේශ ණය සේවා ගෙවීම් 1982 දී රුපියල් දශ ලක්ෂ 5,292 (විගැහි දශ ලක්ෂ 231) සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 7,094 (විගැහි දශ ලක්ෂ 285) ක් දක්වා වැඩි විය. ප්‍රමාණවත් තොරතුරු නොමැතිවීම නිසා 1981 ට පෙර ගත් කෙටි කාලීන ණය සඳහා වූ ණය සේවා ගෙවීම් වලට අදාළ දත්තයන් සංඛ්‍යා සටහනට ඇතුළත් කොට නැත. මෙම හේතුව නිසාම මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ වූ ව්‍යවසායයන් විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක වලින් ගත් ණය සහ එම ඒකක වලින් ගත් වර්ග කල නොහැකි ණයද සංඛ්‍යා සටහනේ අඩංගු නොවේ. කෙසේ වුවද ණය සේවා අනුපාතය ගණනය කිරීමේදී මෙම ණය මත වූ පොළී ගෙවීම් ඇතුළත්ව ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිමිළදී ගැනීම් සහ පොළී ගෙවීම් පෙර වසරේ පැවති රුපියල් දශ ලක්ෂ 1,666 (විගැහි දශ ලක්ෂ 72) සමග සසඳන කල 1983 දී රුපියල් දශ ලක්ෂ 1,847 (විගැහි දශ ලක්ෂ 77) ක් ව පැවතුනි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගණුදෙනු ද ඇතුළත්වූ මුළු ණය සේවා ගෙවීම්, වෙළඳ භාණ්ඩ අපනයන සහ සේවා ඉපැයුම්වල අනුපාතයක් ලෙස ගත්කල 1982 දී සියයට 18.9 ක් වූ අතර 1983 දී එය සියයට

21.6 ක් විය. මෙම අනුපාතය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගණුදෙනු අත්හැර ගණනය කළ විට මෙම වර්ෂ දෙක අතර සියයට 12.9 සිට සියයට 16 ක් දක්වා ඉහළ නැගුනි. සමස්ථ ණය සේවා ගෙවීම්, වෙළඳ භාණ්ඩ අපනයන හා සේවා ඉපැයුම් සහ විදේශයන්හි සේවය කරන්නන්ගේ ප්‍රේෂණවල අනුපාතයක් ලෙස ගත්කල එය 1982 දී සියයට 15.5 ක් වූ අතර 1983 දී සියයට 17.9 ක් විය.

## රාජ්‍ය මූල්‍ය කටයුතු

1982 වර්ෂයට වඩා සැළකිය යුතු ප්‍රගතියක් 1983 වර්ෂයේ රාජ්‍ය මූල්‍ය කටයුතුවලින් පෙන්නුම් කෙරින. වඩාත් වැදගත් වූයේ,වර්තන ගිණුමේ සමතුලිතතාවයක් සාක්ෂාත් කර ගන්නා අතරම, ප්‍රාග්ධන වියදම්වලින් සියයට 95 ක් දක්වා ප්‍රමාණයක් උද්ධමනකාරී නොවන මාර්ගයන්ගෙන් පියවා ගැනීමයි.

### සමස්ත රාජ්‍ය මූල්‍ය තත්ත්වය

අත්තිකාරම් ගිණුම් සඳහා කළ වියදම් ඇතුළත්ව වර්ෂය සඳහා වූ රජයේ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 46,772 ක් වූ අතර, පසුගිය වසර හා සසඳන විට රුපියල් දශ ලක්ෂ 8,872 ක් නැතහොත් සියයට 23 ක වැඩිවීමක් එයින් පෙන්නුම් කෙරින. රජයේ මුළු වියදම් වර්ධනය වීමේ අනුපාතිකය සියයට එකකින් වැඩි වූ අතර, දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් එහි කොටස සියයට 38 ක්ව ස්ථාවරව පැවතුණි. පසුගිය වසරේ අත්තිකාරම් ගිණුම් යටතේ සටහන් වූ රුපියල් දශ ලක්ෂ 879 ක ශුද්ධ ලැබීම් වෙනුවට මේ වසරේ රුපියල් දශ ලක්ෂ 1,120 ක ශුද්ධ ගෙවීමක් සටහන් විය. රුපියල් දශ ලක්ෂ 25,210 ක් වූ රජයේ ආදායම් ලැබීම් මගින් රුපියල් දශ ලක්ෂ 7,401 ක් නැතහොත් සියයට 42 ක සැළකිය යුතු ආදායම් වර්ධනයක් වූ අතර, එය වර්තන ගිණුමේ රුපියල් දශ ලක්ෂ 132 ක අතිරික්තයක් ඇති වීමට සහ එමගින් මුළු ආයෝජන සම්පත්වලින් කොටසක් සපයනු ලැබීමට හේතු විය. ප්‍රාග්ධන වියදම්වල ප්‍රමාණය සියයට 16 ක වැඩිවීමක් සහිතව රුපියල් දශ ලක්ෂ 21,694 කට සීමාවිය. පසුගිය වසරේදී ප්‍රාග්ධන වියදම්වල වැඩිවීම සියයට 40 ක් විය. අයවැය හිඟය රුපියල් දශ ලක්ෂ 21,562 ක් වූ අතර, එය දළ ජාතික නිෂ්පාදිතයේ කොටසක් වශයෙන් සියයට 18 ක් විය. පසුගිය වසරේදී අයවැය හිඟය දළ ජාතික නිෂ්පාදිතයේ අනුපාතිකයක් වශයෙන් සියයට 20 ක් විය.

අයවැය හිඟය දේශීය හා විදේශීය මූලයන්ගෙන් ලබාගත් සම්පත් මගින් පියවා ගන්නා ලදී. හිඟයෙන් සියයට 51 ක් විදේශීය මූලයන්ගෙන් පියවා ගන්නා ලද අතර, මෙම ප්‍රමාණය 1982 දී සියයට 44 ක් විය. ඉලක්ක කරගනු ලැබූ රුපියල් දශ ලක්ෂ 14,024 ක් වෙනුවට ලැබූ මුළු විදේශීය මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 10,902 ක් විය. ව්‍යාපෘති ණය, භාණ්ඩ ණය සහ වෙනත් ණය යටතේ පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 5,150 ක්, රුපියල් දශ ලක්ෂ 1,467 ක් සහ රුපියල් දශ ලක්ෂ 860 ක් ලැබුණු අතර, දීමනා වශයෙන් ලද ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,425 ක් විය.

දේශීය සම්පත් අතුරින් බැංකු නොවන වෙළෙඳ පොළ ණය ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 7,762 ක් විය. වෙළෙඳ පොළින් පරිබාහිරව බැංකු නොවන මූලයන්ගෙන් ලබාගත් ණය රුපියල් දශ ලක්ෂ 2,389 ක් විය. සමස්ත අයවැය හිඟය පියවීම සඳහා මෙසේ ලබාගත් සියළුම සම්පත් ප්‍රමාණවත් නොවූ නිසා රුපියල් දශ ලක්ෂ 1,203 ක මුදලක් බැංකු අංශයෙන් ලබා ගැනීමට සිදු විය. රුපියල් දශ ලක්ෂ 36 ක රුපියල් ණය ආපසු ගෙවීම සහ රුපියල් දශ ලක්ෂ 694 ක මුදල් ශේෂ වැඩිවීම් සහිතව වසරේ රාජ්‍ය මූල්‍ය කටයුතුවලින් ඇති වූ ප්‍රසාරණාත්මක බලපෑම් රුපියල් දශ ලක්ෂ 473 ක් විය.

1983 වසර සඳහා වන රාජ්‍ය මූල්‍ය කටයුතුවල සම්පිණ්ඩනයක් 1.47 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. ඉකුත් වසර නවය සඳහා සංසන්දනාත්මක දත්තයන් සමඟ 1983 වසරේ රාජ්‍ය මූල්‍ය කටයුතු නිසා ඇතිවූ ශුද්ධ මූල්‍ය හිඟය සංඛ්‍යා ලේඛන පරිශිෂ්ටයේ දක්වා ඇත.